**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

පදනම් විභාගය - ජනවාරි 2015

## (52) ආර්ථික විද්‍යාව
(Economics)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර ප්‍රශ්න සඳහා අයදුම්කරුවන් පිළිතුරු සැපයීමේදී තරමක පසුබෑමක් දක්නට ලැබුණි. එසේ වීමට හේතු වශයෙන් උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයට ලක්වූ ඇතැම් දුර්වලතා පහත දැක්වේ:

## <u>A - කොටස</u>

**ප්‍රශ්න අංක 01 - ලකුණු** 40 (ලකුණු 02 බැගින් බහුවරණ ප්‍රශ්න 20)
**(අනිවාර්ය ප්‍රශ්නයකි)**

මෙම ප්‍රශ්නය සකස් කර ඇත්තේ සමස්ථ විෂය නිර්දේශය හා ආර්ථික විද්‍යාවට සම්බන්ධ ප්‍රායෝගික දැනුම ආවරණය වන ආකාරයට වේ. අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ප්‍රශ්නයට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

එහෙත් මෙම ප්‍රශ්න 20 සඳහා පිළිතුරු සැපයීමේ හැකියාව කුමන මට්ටමක පැවතියේ ද යන්න මැනීමට අයදුම්කරුවන්ගෙන් නියැදියක් අහඹු ලෙස තෝරා ගෙන නිරීක්ෂණය කිරීමේදී ප්‍රශ්න අංක (D), (F), (H), සහ (N) යන ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් බව දක්නට ලැබුණි. ඒ අනුව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ට නිරීක්ෂණය වූ පහත දැක්වෙන අඩුපාඩු දැක්විය හැකිය.

**<u>(D) ප්‍රශ්නය සඳහා</u>**

මිල ඉල්ලුම් නම්‍යතාවය සහ පාරිභෝගික වියදම අතර සම්බන්ධතාවය පිළිබඳ දැනුම මැනීම අපේක්ෂිත වුවත් එය නිවැරදිව දැක්වීමට අයදුම්කරුවන් අපොහොසත් වී තිබුණි. බහුතරයක් තෝරා තිබුණේ "වෙනස් නොවීමයි" යන තුන්වන පිළිතුරයි. ඒ අනුව අයදුම්කරුවන් විසින් මිල ඉල්ලුම් නම්‍යතාවය සහ පාරිභෝගික වියදම අතර ඇති අන්තර් සම්බන්ධතාවය පිළිබඳ දැනුම නිවැරදිව ලබා ගත යුතුය.

**<u>(F) ප්‍රශ්නය සඳහා</u>**

ඉල්ලුම් සැපයුම් සමීකරණ ආශ්‍රයෙන් සමතුලිත ප්‍රමාණය මැනීම මෙයින් අපේක්ෂා කළද බොහෝ අයදුම්කරුවන් තෝරාගෙන තිබුණේ පළමු පිළිතුර වූ "සමතුලිත මිල" යන්නයි. එයින් පිළිබිඹු වන්නේ අනවබෝධයෙන් ප්‍රශ්නය කියවා පිළිතුර තෝරා ඇති බවයි. එසේම සමගාමී සමීකරණය විසඳීමේ ගැටළු ද තිබුණා විය හැකිය.

**<u>(H) ප්‍රශ්නය සඳහා</u>**

ආදේශක හා අනුපූරක භාණ්ඩවල මිල හා ඉල්ලුම අතර නිවැරදි සම්බන්ධතාවය මැනීම අපේක්ෂිත වුවත් ඒ සඳහා වැරදි පිළිතුර තෝරා ගැනීම නිසා ආර්ථික විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ දැනුම බහුතරයක් අයදුම්කරුවන්ට නිසි අයුරින් නොමැති බව මනාව පැහැදිලිය. එම නිසා අයදුම්කරුවන් විසින් ආර්ථික විද්‍යා මූලික සංකල්ප පිළිබඳ දැනුම වැඩි දියුණු කර ගත යුතුය.

**<u>(N) ප්‍රශ්නය සඳහා</u>**

නිමිති මුදල් (Token Money) යන්නෙහි අදහසට වැඩි දෙනෙක් නිවැරදි පිළිතුර ලකුණු කර නොතිබුණි. එම නිසා අයදුම්කරුවන් විසින් මුදල් පිළිබඳ නිවැරදි නිශ්චිත දැනුමක් ලබා තිබීම වැදගත් වේ.

මේ අනුව පළවැනි ප්‍රශ්නයට පිළිතුරු සපයා වැඩි ලකුණු ලබා ගැනීමට විෂය නිර්දේශයට අයත් න්‍යායාත්මක සංකල්ප හා ආර්ථික විද්‍යා විෂයට අදාළ අනෙකුත් ප්‍රායෝගික දැනුමෙන් අයදුම්කරුවන් වඩාත් දැනුවත් විය යුතුය.

## B කොටස

මෙම කොටස ප්‍රශ්න 6 කින් සමන්විත වූ අතර එයින් අයදුම්කරුවන් විසින් තෝරාගත් ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු සැපයිය යුතු විය.

**ප්‍රශ්න අංක 02 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) සෑම ආර්ථිකයක්ම මුහුණදෙන තෝරාගැනීමේ ප්‍රශ්නය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම මැනීම මෙම කොටසින් අපේක්ෂිතයි. මෙම ප්‍රශ්නයට බහුතරයක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයෙන් අසා තිබුණු පිළිතුර පිළිබඳව අනවබෝධයෙන් කරුණු ඉදිරිපත් කර තිබීම දක්නට ලැබුණි.

උදා:

(1) කුමක්, කෙසේ, කාහට යන මූලික ආර්ථික ප්‍රශ්න 3 පිළිබඳව දිගින් දිගටම විස්තර කර තිබීම.

(2) ආවස්ථික පිරිවැය පිළිබඳ සංකල්පය විස්තර කිරීම.

(3) සම්පත්වල විකල්ප ප්‍රයෝජන පවතින බව දක්වා නොතිබීම.

(b) අයදුම්කරුවන් බහුතරයක් මිශ්‍ර ආර්ථික ක්‍රමයේ ලක්ෂණ 5 ක් නිවැරදිව දැක්වීමෙන් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් වූහ. එමගින් පෙනී යන්නේ මිශ්‍ර අර්ථ ක්‍රමය පිළිබඳ අයදුම්කරුවන් ගේ දැනුම ප්‍රමාණවත් බවය.

(c) ආදායම් ප්‍රතිවිපාකය හා ආදේශව ප්‍රතිවිපාකය කෙටියෙන් පැහැදිලි කිරීම නිවැරදිව කර තිබුණේ අයදුම්කරුවන් ඉතා සුළු පිරිසකි. බහුතරයක් අයදුම්කරුවන් එම සංකල්ප පිළිබඳව නිශ්චිත අවබෝධයකින් තොරව පිළිතුරු ලියා තිබූ බව පහත දැක්වෙන අඩුපාඩු වලින් මනාව සනාථ වේ:

(1) ආදායම් ප්‍රතිවිපාකය ලෙස පාරිභෝගික ආදායමේ සිදුවන වෙනස්වීම් ඉල්ලුමට බලපාන බව දැක්වීම.

(2) භාණ්ඩයක මිල අඩුවීම ක්‍රය ශක්තිය වැඩිවීමට බලපාන බව පැහැදිලි නොකිරීම.

(3) ආදේශන ප්‍රතිවිපාකයේදී සාපේක්ෂ මිල වැඩිවීම පිළිබඳව දක්වා නොතිබීම.

**ප්‍රශ්න අංක 03 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) "සැපයුම් සංකල්පය" පිළිබඳ අයදුම්කරුවන් සතු මූලික දැනුම මෙම ප්‍රශ්නයෙන් මැනීමට අපේක්ෂා කර ඇත. ප්‍රශ්නයේ;

(I) කොටස සඳහා බහුතරයක් අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් මිලත් සැපයුම් ප්‍රමාණයත් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බව දැක්වීම, පැවති පොදු දුර්වලතාවයකි.

(II) කොටසටද සාර්ථක පිළිතුරු සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් සැපයුමට බලපාන සාධක 4 දැක්වීමේදී "සළකා බලන භාණ්ඩයේ මිල හැර" යන්න ප්‍රශ්නයේ දක්වා තිබුණද එය නොසැලකූ බවක් දක්නට ලැබුණි. එසේම අතලොස්සක් අයදුම්කරුවන් ඉල්ලුමට බලපාන සාධකද අල්ප වශයෙන් දක්වා තිබුණි.

(b) ප්‍රස්තාරයක් ආධාරයෙන් පූර්ණ තරඟකාරී වෙළෙඳපොලක ඉල්ලුම් වක්‍රය හා පූර්ණ තරඟකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම ප්‍රශ්නයේ මෙම කොටසින් අපේක්ෂිතය. මේ සඳහා නිවැරදි පිළිතුරු ප්‍රස්තාර සහිතව ඉදිරිපත් කර තිබුණේ ඉතා අතලොස්සක් පමණි. එයට හේතු වශයෙන්,

(1) පූර්ණ තරඟකාරී වෙළෙඳපොල ඉල්ලුම් වක්‍රය හා පූර්ණ තරඟයේ ආයතනයක ඉල්ලුම් වක්‍රය මාරු කර ඇඳ තිබීම,

(2) ආයතනයේ ඉල්ලුම් වක්‍රය වමේ සිට දකුණට බෑවුම් වන බව දැක්වීම,

(3) ඉල්ලුම් වක්‍ර පිළිබඳ පැහැදිලි කිරීම් නිවැරදි නොවීම,

උදා:



ආයතනයේ ඉල්ලුම් වක්‍රය



වෙළෙඳපොල ඉල්ලුම් වක්‍රය



ආයතනයේ ඉල්ලුම් වක්‍රය

ආදිය දැක්විය හැකිය.

(c) "ඒකාධිකාරී වෙළෙඳපොලක කෙටිකාලයේ මෙන්ම දිගුකාලයේදී නිෂ්ප්‍රමාණික ලාභ උපයයි" යන කියමනට බොහෝ අයදුම්කරුවන් "එකඟ වේ" යනුවෙන් දැක්වුවද එසේ එකඟවීමට හේතු තර්කානුකූලව ඉදිරිපත් කර නොතිබීමෙන් අඩු ලකුණු ලබා ගැනීමට සිදුවිය. බොහෝ අයදුම්කරුවන් අඳින ලද ප්‍රස්තාර නිවැරදි නොවීම මෙහි කැපී පෙනෙන දුර්වලතාවයක් විය.

**ප්‍රශ්න අංක 04 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) උපේක්ෂා වක්‍ර සම්බන්ධයෙන් අයවැය රේඛාව යනු කුමක්ද යන්න දැක්වීම බොහෝ අයදුම්කරුවන්ට අපහසු බවක් දක්නට ලැබුණි. එසේම මෙම ප්‍රශ්නයේ II කොටසටද ඉතාමත් අසාර්ථක පිළිතුරු සපයා තිබුණි. සංඛ්‍යාත්මකව එය දැක්වීම සම්බන්ධයෙන් අයදුම්කරුවන් තුළ පැවති අනවබෝධය වඩාත් කැපී පෙනුණි.

(b) ප්‍රශ්නයේ මෙම කොටස සරල බවක් පෙන්නුම් කළද සාර්ථක පිළිතුරු දක්නට නොලැබුණි. උපේක්ෂා වක්‍ර හා උපයෝගිතා න්‍යායන් පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම වඩාත් ප්‍රගුණ කර ගත යුතු බවට දුර්වලව ඉදිරිපත් කළ පිළිතුරු වලින් සනාථ වේ.

(c) ප්‍රශ්නයේ මෙම කොටසින් අසා තිබූ පරිමාණනානුකූල ඵල යන්නෙහි අදහස දක්වා එහි අවස්ථා දැක්වීම බහුතරයක් අයදුම්කරුවන් විසින් සාර්ථකව කර තිබුණි.

**ප්‍රශ්න අංක 05 - ලකුණු 15**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) ජාතික ආදායම ගිණුම්ගත කිරීමේ ප්‍රවේශයන් බහුතරයක් අයදුම්කරුවන් විසින් නිවැරදිව දක්වා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් එම ප්‍රවේශ අනවශ්‍ය ලෙස දිගින් දිගටම විස්තර කිරීම පැවති දුර්වලතාවයකි.

**(b)** 2013 වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය සාර්ථක ලෙස ගණනය කර සම්පූර්ණ ලකුණු ලබා ගත් පිරිස බහුතරයක් විය. එහෙත් සමහර අයදුම්කරුවන් අනවබෝධය නිසා ක්ෂය වීම් සඳහා ගැලපීම් සිදු කිරීමෙන් තමාට ලැබිය යුතු ලකුණු අහිමි කරගෙන තිබුණි. එසේම ආර්ථික වර්ධන වේගය ගණනය කිරීමේදී පහත දැක්වෙන අඩුපාඩු හේතුකොටගෙන එයට හිමි මුළු ලකුණු අහිමි කරගෙන තිබුණි.

(i) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය වැරදි දත්ත යොදාගෙන ගණනය කිරීම.

(ii) පවත්නා වෙළෙඳපොළ මිලෙන් මූර්ත දළ ජාතික නිෂ්පාදිතය අඩු කර ගැලපීම.

(iii) වර්ධන අනුපාතිකය අනුපාතිකය ප්‍රතිශතයක් ලෙස නොදැක්වීම.

## ප්‍රශ්න අංක **06** - ලකුණු 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) මුදලේ නෛසර්ගික වටිනාකම සහ මුහුණත වටිනාකම යන සංකල්ප අතර වෙනස දැක්වීම නිවැරදිව කර තිබුණේ අයදුම්කරුවන්ගෙන් ඉතා සුළු පිරිසකි. මුදල් වල නෛසර්ගික වටිනාකම සඳහා මුදලේ ක්‍රය ශක්තිය, නීතිමය වටිනාකම වැනි වැරදි පැහැදිලි කිරීම් දක්නට ලැබුණි. සරල ප්‍රශ්නයක් වුවත් බොහෝ අයදුම්කරුවන්ට අඩු ලකුණු ලැබීමට ඉහත සඳහන් කරුණු හේතු විය.

(b) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම කොටසට සාර්ථක පිළිතුරු සපයා එයට හිමි සම්පූර්ණ ලකුණු හිමිකර ගැනීමට සමත් විය. එහෙත් භාණ්ඩ හා සේවා මිලට ගැනීමට මුදල් අවශ්‍ය වන නිසා මුදලට ඉල්ලුමක් ඇතිවන බව අයදුම්කරුවන් සුළු පිරිසක් විසින් දක්වා තිබුණි. එසේම මුදලට ඇති ඉල්ලුමෙහි චේතනා 3 නිවැරදිව සටහන් කළද ඒවා වැරදි ලෙස පැහැදිලි කිරීම නිසා ලකුණු අහිමිකරගත් අවස්ථා දක්නට ලැබුණි. මුදලේ කාර්යයන් හා හොඳ මුදලක ලක්ෂණ යනාදිය මුදලට ඇති ඉල්ලුමෙහි චේතනා වශයෙන් සඳහන් කළ අයදුම්කරුවන් සුළු පිරිසක්ද විය.

(c) උද්ධමනය පාලනය කිරීම සඳහා අනුගමනය කළ හැකි පියවර 4 ක් ඉදිරිපත් කිරීමේදී බහුතරයක් අයදුම්කරුවන් විසින් අනවශ්‍ය කරුණු ඉදිරිපත් කර තිබුණි.
උදා:

(1) ජීවන වියදම පහත දැමීම.

(2) ඉතුරුම් හා ආයෝජන සඳහා ජනතාව උනන්දු කිරීම.

(3) ආර්ථික වර්ධනය ඇති කිරීම.

(4) මිල පාලනය යටතේ (අවම මිල, උපරිමිල) කරුණු දැක්වීම.

කෙසේ වුවත් වැඩි අයදුම්කරුවන් පිරිසක් මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන තිබීම වැදගත් ලක්ෂණයක් විය.

## ප්‍රශ්න අංක **07** - ලකුණු 15
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** රාජ්‍ය මූල්‍ය ආශ්‍රිත සංකල්ප පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම අවබෝධය මෙම ප්‍රශ්නයෙන් මැනීමට අපේක්ෂා කර ඇත. ආදායම සාධාරණව බෙදා හැරීමට අනුගමනය කළ යුතු උපාය මාර්ග පිළිබඳව සාර්ථකව පිළිතුරු සපයා එම කොටසට හිමි උපරිම ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන් බහුතරයකට හැකිවී තිබුණි.

(b) සමස්ථ අයවැය හිඟයෙහි අදහස දැක්වීමේදී සාර්ථකව එය සිදුකර තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් "රාජ්‍ය" යන්න සඳහන් කිරීමෙන් තොරව ආදායම් වියදම් අතර පරතරය ලෙස දක්වා තිබීම දක්නට ලැබුණු පොදු දුර්වලතාවයකි.

එසේම අයවැය හිඟය පියවීමේ ප්‍රසාරණාත්මක හා ප්‍රසාරණාත්මක නොවන මූලාශ්‍ර පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොවූ බව දක්නට ලැබුණි. සමහර අයදුම්කරුවන් ප්‍රසාරණාත්මක හා ප්‍රසාරණාත්මක නොවන යන්න වෙන් කිරීමෙන් තොරව වගු සටහනක් ද යොදාගෙන ඒ සඳහා පිළිතුරු දක්වා තිබුණි.

(c) ගතවූ වර්ෂ කිහිපය තුළදී ශ්‍රී ලංකාවේ සාර්ථක ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීමට හේතු වූ කරුණු ඉදිරිපත් කිරීම බොහෝ දුරට සාර්ථකව පැවතුණි. වැඩි අයදුම්කරුවන් පිරිසකට යුද්ධය අවසන් වීම, යටිතල පහසුකම් වල දියුණුව, විදේශ ආයෝජන, සංචාරක කර්මාන්තයේ දියුණුව ආදී කරුණු ඉදිරිපත් කර තිබීමෙන් උපරිම ලකුණු ලබා ගැනීමට හැකි වී තිබුණි. එසේම අනවශ්‍ය කරුණු සහ එකම කරුණ වෙන වෙනම දැක්වූ අවස්ථාද දක්නට විය.

උදා: යටිතල පහසුකම් ලෙස සමස්ථය නොදක්වා,

(I) ගුවන්තොටුපල ඉදි කිරීම.

(II) අධිවේගී මාර්ග ඉදි කිරීම.

(III) වරාය ඉදිකිරීම.

ආදී වශයෙන් ඉතාමත් දුර්වල පිළිතුරු ද දක්නට ලැබුණි.

කෙසේවුවත් ආර්ථික විද්‍යාව පසුබිම් කරගත් ප්‍රයෝගික කරුණු මැනීම පිළිබඳ ප්‍රශ්නයක් වූ මෙයට බහුතරයක් නිදහසේ පිළිතුරු ඉදිරිපත් කර තිබූ බවක් දක්නට ලැබුණි.

- - -

<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>

1. සම්පූර්ණ විෂය නිර්දේශය හොඳින් අධ්‍යයනය කර තිබීම.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත ඍජු පිළිතුරු සැපයිම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.
3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.
4. ප්‍රස්තාර හරියාකාරව නම් කිරීම හා පැහැදිලි කිරීම.
5. පිළිතුරු ලිවීමේදී න්‍යායාත්මක සංකල්ප විධිමත්ව ඉදිරිපත් කිරීම, අවශ්‍ය තැන්හි උදාහරණ මගින් ඉදිරිපත් කිරීමට උත්සාහ කිරීම වැදගත් වේ.
6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.
7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.
9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.
10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
11. උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -